# හැඳින්වීම

පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි "කෝලම් නාටකය", ලංකාවේ දකුණු ප්‍රදේශයේ (මුහුදුබඩ) හා බටහිර ප්‍රදේශයන් හි ස්ථානගත වී තිබේ. අනෙකුත් ගැමි නාටක අතුරින් කැපී පෙනෙන රංග ශෛලියක් විදහා දක්වන කෝලම් නාටකය, හාස්‍ය හා උපහාස රසයන් ප්‍රධාන කොට ගෙන නිර්මාණය වී තිබේ. "වෙස් මුහුණු භාවිතය" යන සුවිශේෂී කරුණ පදනම් කොට ගෙන කෝලම් නාටක, අවශේෂ ගැමි නාටක අතුරින් ප්‍රමුඛස්ථානයක් ලැබ තිබේ. විද්වත් විචාරයන්ට අනුව වේශය, පෙනුම, හැඩය .... ආදී වූ විවිධ අර්ථපූර්ණයන් සහිත ව 'කෝලම්' යන පදය භාවිතයේ පවතී. "පුරාණයේ මහා සම්මත රජ දවස මැණිකපාල බිසවට වැදෑරුණු 'කවට සිතාවෙන් ගුත් රඟුම් නැටීමේ' දොළ දුක සංසිඳවීමට ප්‍රථම කෝලම් රංගනය පැවැත් වූ බව කෝලම් උපත පිළිබඳ විශ්වාසයේ දී හෙළි වේ."

සමාජයේ උසස් යැයි සම්මත සමාජ තලයන් හි වැජඹෙන බලවතුන් ගේ චරිත මෙන් ම, පහළ පන්තියේ පීඩාකාරී ජීවිත ගත කරන්නා වූ පුද්ගල චරිත සතු දුර්ගුණ හා දුර්වලතා උකහා දක්වමින් එම චරිතයන් උපහාසයට ලක් කරමින් කෝලම් නාටක නිර්මිත වී තිබේ. "සාම්ප්‍රදායික සහ යටත් විජිතවාදී සිංහල සමාජයක එදිනෙදා ජීවිතය පිළිබිඹු වීම, සමාජ යථාර්ථයන් විවේචනයට ලක්කිරීම හා ජීවිතය පිළිබඳ දැකුම් දර්ශනයක් ඉදිරිපත් කිරීම" යන අර්ථ නිරූපණයන් කෝලම් නාටකයන් තුළින් ඉදිරිපත් වේ. කෙසේ වෙතත් "කෝලම් නාටක" සර්ව කාලීන ජන නාටක විශේෂයක් ලෙස හැඳින්වීම වඩා යෝග්‍ය යැයි හැඟේ.

මෙම නිබන්ධනයේ ප්‍රථම පරිච්ඡේදය තුළින්, හැඳින්වීමට අමතර ව පර්යේෂණ ගැටළුව හා උපකල්පනය පිළිබඳ ව සඳහන් කෙරේ. එලෙස ම මාගේ අභිමතාර්ථයන් තුට ප්‍රත්‍යක්ෂ කර ගැනීම උදෙසා, තෝරා ගත් විචල්‍යයන් කිහිපයක් ඔස්සේ සාකච්ඡා කිරීමට අපේක්ෂා කරමි. පර්යේෂණයට අදාළ අධ්‍යයන ප්‍රදේශ හෝ ක්ෂේත්‍රය පිළිබඳ ව හඳුනා ගැනීමෙන් පසු, එහි දී මුහුණ දීමට සිදු වන විවිධ ගැටලු කෙරෙහි අවධානය යොමු කෙරේ. අවසාන වශයෙන් පර්යේෂණ ක්‍රමවේදයන් ඉදිරිපත් කර මූලාශ්‍ර හැඳින්වීමට බලාපොරොත්තු වේ.

දෙවන පරිච්ඡේදය ආරම්භ කෙරෙනුයේ ලංකාවේ සිංහල ගැමි සමාජයෙන් බිහි වූ "ජනශ්‍රැතිය නොහොත් ජන වහර" (Falk lore) පිළිබඳ ව කෙටි හැඳින්වීමකිනි. ඒ ඔස්සේ විග්‍රහ කරමින් ජනශ්‍රැතිය තුළින් බිහි වූ ගැමි නාටක හඳුනා ගැනීම හා විවිධ වූ ගැමි නාටක විශේෂ අතුරින් "කෝලම් නාටක" හඳුනා පිවිසීමට අදහස් කරමි. "කෝලම්" යන පදයේ වචනාර්ථය ඉස්මතු කිරීම සඳහා විවිධ නිර්වචන, විවිධ සංස්කෘතීන්ගෙන් ලත් ආභාසය (විවිධ භාෂාවන්ගෙන්) පැහැදිලි කිරීමක් ද සිදු වේ. "කෝලම්" වචනය සඳහන් ඉපැරණි සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය කොට නිදසුන් ඉදිරිපත් කිරීමට ද අපේක්ෂා කෙරේ. අවස්ථානුකූල ව විවිධ හැඟීම් නිරූපනය කිරීම සඳහා ව්‍යවහාරයේ දී "කෝලම්" වචනය භාවිතයේ යෙදෙන ආකාරය අනුව එය කෙසේ අප ගේ ජීවිත හා සමීප ද යන්න මින් අවබෝධ කොට ගත හැකි ය. කෝලම් නාටකයේහි ප්‍රභවය පිළිබඳ ව කෙරෙන සඳහන මෙම පරිච්ඡේදයේ සුවිශේෂී අවස්ථාව ලෙස දැක්විය හැකි ය. කෝලම් උපත හා සම්බන්ධ ව කියැවෙන විවිධ රජවරුන් පිළිබඳ නොයෙක් මූලාශ්‍ර ගත සාධකයන් ඉදිරිපත් කිරීමට ද බලාපොරොත්තු වේ. පොදු සම්මත විධිය අනුව කෝලම් නාටකයක් රංග ගත වීමේ දී අත්‍යවශ්‍ය වන නළු භාණ්ඩයන් (කෝලම් අංග, රංග පෙළ) සැකෙවින් පෙළ ගැස්වීමට ද අදහස් කෙරේ. "කෝලම් තුට්ටම්" සඳහා (කෝලම් නළු කණ්ඩායම්) ප්‍රසිද්ධියක් උසුලන ලංකාවේ විවිධ ප්‍රදේශයන් හඳුනා ගනිමින් මෙම පරිච්ඡේදය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

කෝලම් නාටක රඟ දැක්වීම සඳහා ලංකාවේ ප්‍රසිද්ධියට පත් ව සිටින ගුරු පරම්පරාවන් හඳුනා ගැනීමක් සමඟ තෙවන පරිච්ඡේදය ආරම්භ වේ. එම පරම්පරාවන් අතුරෙන්, මෙම පර්යේෂණයට අදාළ "අම්බලන්ගොඩ පුවන්වඩු පරම්පරාව" පිළිබඳ පුළුල් විස්තරයක් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ. එයට අමතර ව අම්බලන්ගොඩ නගරය, මෙම කෝලම් කලාවට කෙසේ දායකත්වයක් දක්වන්නේ ද යන්න කෙටියෙන් පැහැදිලි කෙරේ. "පුවන්වඩු පරපුරට" අයත් ප්‍රධාන කලා සාධක (ගුරුන්) පිළිබඳ හඳුනා ගැනීම හා එම පරපුරේ ක්‍රමික විකාශනය කෙරෙහි අවධානය යොමු කෙරේ. පුවන්වඩු ගුරුකුලය සතු ව කෝලම් නාටක පිළිබඳ සඳහන් පැරණි සාධක (පුස්කොළ පොත්, අත්පිටපත්) සියළු නම් ඒවා විමර්ශනය කොට කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. පුවන්වඩු පරම්පරාව විසින් ඉදිරිපත් කරනු ලබන "කෝලම් නාටකයක" රංග අනුපිළිවෙල සඳහන් කොට එම පරපුරේ එදා මෙදා තුර කෝලම් නාටකවල රඟ පෑ ශිල්පීන් හඳුනා ගැනීමක් ද සිදු කෙරේ.

"මහ අම්බලන්ගොඩ, ධූත්තාවඩු ගුරුකුලය" පිළිබඳ ව මීළඟට අධ්‍යයනය කෙරේ. ඉහත සඳහන් කළ ආකාරයට මේ පරපුරේ වංශාවලිය, විකාසනය හා වර්තමාන තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරලීම ප්‍රධාන කටයුත්තකි. ධූත්තාවඩු ගුරු පරම්පරාවේ කෝලම් නාටකයක අඩංගු වන අංගයන් හඳුන්වා දී, රංගපෑමෙන් දායක වූ ශිල්පීන් පිළිබඳව ස්මරණය කරමින් මෙම පරිච්ඡේදය සමාප්ත වේ.

සිව් වන පරිච්ඡේදය වෙන් වන්නේ උක්ත විශ්ලේෂණ කාර්යය උදෙසා ය. පළමුවෙන් ම "පුවන්වඩු හා ධූත්තාවඩු" පරම්පරාවන් ගේ කෝලම් නාටකවල අන්තර්ගත වෙනස් ලක්ෂණ ඉස්මතු කොට දක්වීම සිදු කෙරේ. එනම්, පුවන්වඩු පරපුරේ "ගම් නතාව" හා ධූත්තාවඩු පරපුරේ "සභාපති පැමිණීම" යන අංග වෙන වෙන ම සාකච්ඡාවට බඳුන් වේ. එලෙස ම පරම්පරා ද්විත්වයේ පොදු එකඟතා තිබේද ? එසේ නම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමක් ද මෙහි දී සිදු කෙරේ. පුවන්වඩු හා ධූත්තාවඩු ගුරු කුල දෙක අතර (කෝලම් නාටකවල) පවතින වෙනස විවිධ උපකුලකයන් ඔස්සේ තුලනාත්මකව සාකච්ඡා කිරීමට නියමිත ය. සංස්කෘතිය හා කලාව ඔස්සේ මෙම පරම්පරා වෙනසට තුඩු දෙන සාධක තිබේ ද? එසේ නම් ඒ පිළිබඳ ව විද්වත් සංවාදයකට යොමු වීමට අපේක්ෂා කෙරේ. මානව විද්‍යාත්මක වශයෙන් උක්ත පරම්පරා ද්විත්වය කෙරෙන් පහළවන්නා වූ විවිධතා පිළිබඳ අධ්‍යයනයට ලක් කිරීම ද මෙහි දී සිදු කිරීමට නියමිත ය.

අවසාන පරිච්ඡේදය තුළින් පූර්වයෙන් ම බලාපොරොත්තු වන්නේ, මෙම පර්යේෂණය සිදු කිරීමෙන් ලත් නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමට යි. මෙහි කරුණු සියලු දත්තයන් විශ්ලේෂණයෙන් පසු එළඹි නිගමනයන් ඒ ආකාරයෙන් ම දැක්වීමට අපේක්ෂා කරන අතර, මගේ පාර්ශවයෙන් ඉදිරිපත් කරන්නා වූ යෝජනාවන් ද මෙයට ඇතුළත් කෙරේ. උපග්‍රන්ථයෙන් අදාළ වංශාවලී, ඡායාරූප, කවි පොත්, දෙබස්...... ආදිය ඉදිරිපත් කිරීමට නියමිත ය. උක්ත පරිච්ඡේදවල සඳහන් කළ සාධක නිවැරදි ව පැහැදිලි වීම උදෙසා උපග්‍රන්ථය වැදගත් වේ. අවසාන වශයෙන් පරිශීලනය කළ සාහිත්‍ය නාම, පුවත්පත් පෙළ ගස්වමින්, ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් ඉදිරිපත් කොට ඇත.